# මීගමුව අධ්‍යාපන කලාපය
## දෙවන වාර ඇගයීම - 2025
## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

විභාග අංකය:..........................................

| 10 ශ්‍රේණිය | I පත්‍රය | කාලය පැය 01 |
|---|---|---|

**සැලකිය යුතුයි :**

- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතුරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

---

පහත සඳහන් සිද්ධිය ඇසුරින් අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

මෝස්තර හා විලාසිතා නිර්මාණකරණය පිළිබඳ උපාධිධාරිණියක වන ශලනි දේවින්දි විසින් **"රෝයල් ෆැෂන්"** නමින් ඇඳුම් මැසීමේ ව්‍යාපාරයක් නගරාසන්නයේ ආරම්භ කරන ලදී. වර්තමානයේ බොහෝ දෙනා මාර්ග ගත ඇණවුම් ක්‍රමයන්ට හුරුව ඇති නිසා ඇගේ ව්‍යාපාරයද ප්‍රසිද්ධ මාර්ග ගත ඇණවුම් වෙබ් අඩවියක ලියාපදිංචි කර ඉන් ලැබෙන ඇණවුම් සඳහාද ඉතා ඉක්මනින් නිමි ඇඳුම් සැපයීම සිදු කරයි.

1. **"රෝයල් ෆැෂන්"** ව්‍යාපාරය විසින් සපුරාලන මිනිස් අවශ්‍යතාව කුමක්ද?
   1) ආහාර
   2) ඇඳුම්
   3) සෞඛ්‍යය
   4) ප්‍රවාහනය

2. නිෂ්පාදනය කරන නිෂ්පාදිතයේ ස්වභාවය අනුව මෙම ව්‍යාපාරය,
   1) භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයකි.
   2) සේවා නිෂ්පාදන ව්‍යාපාරයකි.
   3) මහා පරිමාණ ව්‍යාපාරයකි.
   4) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයකි.

3. ශලනි විසින් තම අත්දැකීම් යොදා ගෙන අවදානම් දරමින් ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම, කවර නිෂ්පාදන සාධකයක් යටතට ගැනේද?
   1) භූමිය
   2) ශ්‍රමය
   3) ප්‍රාග්ධනය
   4) ව්‍යවසාය

4. ඉහත සිද්ධියට අනුව **"රෝයල් ෆැෂන්"** ව්‍යාපාරය සතු ව්‍යාපාරික අවස්ථාව කුමක්ද?
   1) ශලනි, මෝස්තර හා විලාසිතා නිර්මාණකරණය පිළිබඳ උපාධිධාරිණියක වීම.
   2) නිෂ්පාදනය කරන නිමි ඇඳුම් ඉතා අලංකාර ඒවා වීම.
   3) අවම කාල පමාවකින් මාර්ග ගත ඇණවුම් සඳහා නිමි ඇඳුම් සැපයීමට හැකි වීම.
   4) ප්‍රදේශයේ බහුතරයක් දෙනා මාර්ග ගත ක්‍රමයට භාණ්ඩ ඇණවුම් කිරීමට පෙළඹී සිටීම.

5. **"රෝයල් කේක්"** ව්‍යාපාරය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1) නීතිමය පුද්ගලභාවයක් ඇත.
2) අඛණ්ඩ පැවැත්මක් ඇත.
3) තනි පුද්ගල ව්‍යාපාරයකි.
4) ශලනිගේ වගකීම සීමිතය.

6. ව්‍යාපාරයක් විසින් භාවිතයට ගන්නා ජලය, ප්‍රතිචක්‍රීකරණය කර යළි භාවිතයට ගනී නම්, එම ජලය එකී ව්‍යාපාරයේ නිෂ්පාදන සාධක අතුරින්,

1) භූමියට අයත් වේ.
2) ශ්‍රමයට අයත් වේ.
3) ප්‍රාග්ධනයට අයත් වේ.
4) ව්‍යවසායකත්වයට අයත් වේ.

7. "නිෂ්පාදිත සාධාරණ මිලට ලබා ගැනීම සඳහා උනන්දුවක් දක්වන්නේ, ......................... වන අතර, නිසි පරිදි මුදල් ලබා ගැනීම සඳහා උනන්දුවක් දක්වන්නේ ......................... ය."
උක්ත ප්‍රකාශයේ හිස්තැන් සඳහා නිවැරදි පිළිතුරු පිළිවෙළින් ඇතුළත් වරණය වන්නේ,

1) ගනුදෙනුකරුවන්, සේවකයින්
2) ගනුදෙනුකරුවන්, සැපයුම්කරුවන්
3) සැපයුම්කරුවන්, ගනුදෙනුකරුවන්
4) සැපයුම්කරුවන්, තරඟකරුවන්

8. A - උද්ධමනය
B - රැකියා නියුක්තිය
C - රජයේ සංවර්ධන ව්‍යාපෘති
D - අන්තර්ජාතික වෙළඳ ගිවිසුම්
E - අයවැය යෝජනා

ඉහත සඳහන් කරුණු අතරින්, දේශපාලන පරිසරයට අයත් කරුණක් / කරුණු වන්නේ,

1) A පමණි
2) A සහ B පමණි
3) B සහ D පමණි
4) C සහ E පමණි

9. A - ණය සඳහා පොලී අනුපාතිකය වැඩි කිරීම නිසා ව්‍යාපාරිකයින් ණය ලබා ගැනීම සීමා කරයි.
B - සිය පාරිභෝගික ජීවන රටාව වෙනස් වීම, ව්‍යාපාරවලට ශක්තියකි.

ඉහත ප්‍රකාශ දෙක අතුරින්,

1) A වැරදිය B නිවැරදිය
2) A නිවැරදිය B වැරදිය
3) A සහ B නිවැරදිය
4) A සහ B වැරදිය

10. ව්‍යාපාරයකට පාලනය කල නොහැකි, උපක්‍රමශීලීව මුහුණදිය යුතු අවාසිදායක ව්‍යාපාර පරිසර තත්වයක් වන්නේ,
    1) ශක්තීන්
    2) දුර්වලතා
    3) අවස්ථා
    4) තර්ජන

**පහත සඳහන් සිද්ධිය ඇසුරින් අංක 11 සිට 13 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

*කළමනාකරණ උපාධිධාරියෙකු වන දෙනුවන් විසින් ගෘහ භාණ්ඩ අලෙවි ව්‍යාපාරයක් ආරම්භ කර පවත්වාගෙන යයි. ඔහුගේ ව්‍යාපාරය වැඩි ප්‍රාග්ධනයක් රැස් කර ගත හැකි, අඛණ්ඩ පැවැත්මක් හා නෛතික පුද්ගලභාවයක් සහිත ව්‍යාපාරයක් බවට පත් කර ගැනීමට දෙනුවන් අනාගතයේදී අපේක්ෂාවෙන් සිටියි.*

11. දෙනුවන් ආරම්භ කර පවත්වා ගෙන යන ව්‍යාපාර ආයතනය අයත් වන ව්‍යාපාර සංවිධානය වන්නේ,
    1) ඒක පුද්ගල ව්‍යාපාර
    2) හවුල් ව්‍යාපාර
    3) සංස්ථාපිත සමාගම්
    4) සමිති සංවිධාන

12. දෙනුවන්ගේ අපේක්ෂාවට ගැළපෙන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක් දැයි ඔහු ඔබෙන් විමසයි නම් ඔහුට යෝජනා කල යුතු ව්‍යාපාර සංවිධානය වන්නේ,
    1) ඒක පුද්ගල ව්‍යාපාර
    2) හවුල් ව්‍යාපාර
    3) සංස්ථාපිත සමාගම්
    4) සමුපාකාර සමිති

13. දෙනුවන්ට ඔබ යෝජනා කරන ව්‍යාපාර සංවිධානය, ලියාපදිංචි කල යුතු පනත වන්නේ,
    1) 1918 අංක 06 දරණ ව්‍යාපාර නාම ආඥා පනත
    2) 1890 හවුල් ව්‍යාපාර ආඥා පනත
    3) 1972 අංක 05 දරණ සමුපාකාර සමිති පනත
    4) 2007 අංක 07 දරණ සමාගම් පනත

14. කොමිසම, මණ්ඩලය යනාදී නම්වලින් හඳුන්වන ව්‍යාපාර සංවිධානය වන්නේ,
    1) සංස්ථාපිත සමාගම්
    2) සමුපාකර සමිති
    3) රාජ්‍ය සංස්ථා
    4) රාජ්‍ය දෙපාර්තමේන්තු

15. මිනුවන්ගොඩ විවිධ සේවා සමුපාකාර සමිතිය, සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වන්නේ,
    1) ලාභ අරමුණු කර ගත් පොදු අංශයේ ව්‍යාපාරයකි
    2) ලාභ අරමුණු කර ගත් පෞද්ගලික අංශයේ ව්‍යාපාරයකි
    3) ලාභ අරමුණු කර නොගත් පෞද්ගලික අංශයේ ව්‍යාපාරයකි
    4) ලාභ අරමුණු කර නොගත් පොදු අංශයේ ව්‍යාපාරයකි

16. පහත සඳහන් ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය වන්නේ,
    1) හවුල් ව්‍යාපාරයක හවුල්කරුවෙකුගේ වගකීම යෙදූ ප්‍රාග්ධනයට සීමා වේ.
    2) රාජ්‍ය දෙපාර්තමේන්තුවකට අඛණ්ඩ පැවැත්මක් නොමැත.
    3) ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමෙන් සෑම විටම නෛතික පුද්ගලභාවයක් ලැබේ.
    4) සමුපාකාර සමිතියකට අඛණ්ඩ පැවැත්මක් ඇත.

17) ගිණුම්කරණයේ මූලික අරමුණ වන්නේ,

i. මූල්‍ය තත්ත්වයෙහි යහපත් බව හඳුනා ගැනීම
ii. ව්‍යාපාරයේ ලාභය හෝ අලාභය දැන ගැනීමට
iii. ඇල්මැති පාර්ශව වෙත තීරණ ගැනීම සඳහා තොරතුරු සැපයීමට
iv. නීතිමය අවශ්‍යතා සපුරාලීමට

18) පහත සඳහන් ඒවායින් ගනුදෙනුවක් ලෙස නොසැලකෙන්නේ,

i. රු. 10000 ක බඩු තොගයක් හානි වීම
ii. රු. 5000 ක විදුලි බිල ගෙවීම
iii. රු. 50000 ක බැංකු ණයක් ලබා ගැනීම
iv. රු. 100000 ක් වටිනා යන්ත්‍රයක් මිලදී ගැනීමට තීරණය කිරීම

19) වත්කමක පමණක් පවතින ලක්ෂණ කවරේද?

A - ව්‍යාපාරය විසින් පාලනය කිරීම
B - වර්තමාන බැඳීමකට ලක් වීම
C - අතීත ගනුදෙනුවක ප්‍රතිඵලයක් වීම
D - අනාගතයේදී හිමිකාරීත්වය ලැබීම

i. A හා D ii. A හා C iii. A හා B iv. B හා D

20) ව්‍යාපාරයක ජංගම වත්කම් පමණක් ඇතුළත් කාණ්ඩය වන්නේ,

i. මුදල්/ගෘහ භාණ්ඩ/ණයගැති/තොගය
ii. ඉඩම්/ගොඩනැගිලි/ගෘහ භාණ්ඩ/ණයගැති
iii. ඉඩම්/ගොඩනැගිලි/මුදල්/තොගය
iv. මුදල්/තොගය/ණයගැති/ලැබිය යුතු දෑ

21) වත්කම් හා හිමිකම් වැඩිවීමක් පෙන්නුම් කරන ගනුදෙනුව වන්නේ,

i. සේවකයන්ට රු. 10000 ක වැටුප් ගෙවීම
ii. අයිතිකරු. 100000 ක ප්‍රාග්ධනයක් ආයෝජනය කිරීම
iii. අයිතිකරු. 10000 ක මුදලක් තම පෞද්ගලික ප්‍රයෝජනයට ලබා ගැනීම
iv. රු. 100000 ක බැංකු ණයක් ලබා ගැනීම

22) ව්‍යාපාරයක බාහිර පාර්ශව වලින් ලබා ගත් සම්පත් හඳුන්වන්නේ,

i. හිමිකම ii. වගකීම් iii. වත්කම් iv. ආදායම්

23) ජංගම නොවන වගකීම් පමණක් ඇතුළත් පිළිතුර වන්නේ

i. උකස් ණය/ලීසිං/බැංකු ණය
ii. ණය හිමියෝ/බැංකු ණය/ණය ගැතියෝ
iii. ණය හිමියෝ/කෙටි කාලීන ණය/බැංකු අයිරාව
iv. ලීසිං/උකස් ණය/ආයෝජන

24) හිමිකම වැඩි වීමට බලපාන සාධක වන්නේ,

i. ව්‍යාපාරයේ වියදම් ii. ගැනිලි iii. අතිරේක ප්‍රාග්ධනය iv. ඉහත සියල්ලම

25) 2024.01.31 දිනට නිමල්ගේ ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණය වන්නේ,

වත්කම් = හිමිකම් + වගකීම්

+60000 = +40000 +20000

නිමල් විසින් රු. 15000 ක අතිරේක ප්‍රාග්ධනය යෙදවූ පසු ගිණුම්කරණ සමීකරණය වන්නේ,

i. රු. 75000 = රු. 55000 + රු. 20000
ii. රු. 75000 = රු. 40000 + රු. 35000
iii. රු. 60000 = රු. 55000 + රු. 5000
iv. රු. 60000 = රු. 25000 + රු. 35000

26) ව්‍යාපාර ගනුදෙනුවක් ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය පහත දැක්වේ.
වත්කම් = හිමිකම් + වගකීම්

+20000 = + 20000

ඉහත සමීකරණයට අනුව කුමන ගනුදෙනුවක් සිදු වී ඇත්ද?

i. අයිතිකරු ව්‍යාපාරයෙන් රු. 20000 ක ගැනිලි සිදුකිරීම
ii. ව්‍යාපාරයේ රු. 20000 ක විදුලි බිල ගෙවීම
iii. රු. 20000 ක භාණ්ඩ තොගයක් ණයට ගැනීම
iv. රු. 20000 ක බැංකු ණය ගෙවීම

27) ණයගැතියන්ගේ රු. 10000 ක මුදල් ලැබීමට අදාළ ද්විත්ව බලපෑම වන්නේ,

i. මුදල් වත්කම වැඩිවීම රු. 10000
ණයහිමි වත්කම අඩුවීම රු. 10000
ii. මුදල් වත්කම වැඩි වීම රු. 10000
ණයගැති වත්කම අඩු වීම රු. 10000
iii. ණයගැති වත්කම වැඩිවීම රු. 10000
මුදල් වත්කම අඩුවීම රු. 10000
iv. ණයහිමි වගකීම අඩුවීම රු. 10000
මුදල් වත්කම වැඩිවීම රු. 10000

පහත ගනුදෙනු යොදා ගනිමින් ප්‍රශ්න අංක 28,29,30 සඳහා පිළිතුරු සපයන්න.

A - බැංකු ණය ගෙවීම රු. 5000
B - භාණ්ඩ තොගයක් මිලදී ගැනීම රු. 20000
C - අයිතිකරු ගැනිලි සිදුකිරීම රු. 8000
D - යන්ත්‍රයක් මිලදී ගැනීම රු. 10000

28) වත්කම් හා වගකීම් අඩුවීමට බලපාන ගනුදෙනුව වන්නේ,

i. A ii. B iii. C iv. D

29) හිමිකම වෙනස් වීමට බලපාන ගනුදෙනුව වන්නේ,

i. A ii. B iii. C iv. D

30) C ගනුදෙනුවට අදාළ ද්විත්ව සටහන වන්නේ

i. මුදල් ගිණුම හර රු. 8000
ගැනිලි ගිණුම බැර රු. 8000

ii. ගැනිලි ගිණුම හර රු. 8000
මුදල් ගිණුම බැර රු. 8000

iii. ගැනුම් ගිණුම හර රු. 8000
ගැනිලි ගිණුම බැර රු. 8000

iv. ගැනිලි ගිණුම හර රු. 8000
ගැණුම් ගිණුම බැර රු. 8000

ලෙජරයෙහි දැක්වෙන ගිණුම් වර්ග කිහිපයක් පහත දැක්වේ. ඒ ඇසුරින් ප්‍රශ්න අංක 31,32,33 ට පිළිතුරු සපයන්න

A - වත්කම් ගිණුම
B - වගකීම් ගිණුම
C - ආදායම් ගිණුම
D - හිමිකම් ගිණුම
E - වියදම් ගිණුම

31) වැඩිවීම හර අඩුවීම බැර වාර්තා කරන ගිණුම් වර්ග වන්නේ,

i. A හා B ii. A හා D iii. A හා E iv. E හා C

32) අඩුවීම හර වැඩිවීම බැර වාර්තා කරන ගිණුම් වර්ග වන්නේ,

i. ACE ii. ABD iii. BCD iv. BDE

33) බැංකු ණය ගෙවීම රු. 50000 වාර්තා කර ඇත්තේ,

i. CE ii. BD iii. CD iv. AB

34) නැවත විකිණීම සඳහා භාණ්ඩ තොගයක් මිලදී ගැනීම රු. 10000
ඉහත ගනුදෙනුව වාර්තා කිරීමට අදාළ මූලික පොත කුමක්ද?

i. ගැනුම් ජර්නලය ii. විකුණුම් ජර්නලය iii. මුදල් පොත iv. ගැනුම් ගිණුම

35) ඉහත ගනුදෙනුවට අදාළ මූලාශ්‍ර ලේඛනය කුමක්ද?

i. ගැනුම් ඉන්වොයිසිය ii. විකුණුම් ඉන්වොයිසිය iii. ලදුපත iv. ගෙවීම් වවුචරය

36) ණයට විකිණීමේදී භාවිතා කරන මූලාශ්‍ර ලේඛනය වන්නේ,

i. විකුණුම් ජර්නලය ii. විකුණුම් ඉන්වොයිසිය iii. ලදුපත iv. ගෙවීම් වවුචරය

37) ණයගැති ශෙහාන් විසින් රු .10000 ක ණය පියවීමේදී 5% ක වට්ටමක් ලබා දීමට අදාළ ද්විත්ව සටහන වන්නේ,

i. ණයගැති ගිණුම හර රු. 10000
දුන් වට්ටම් ගිණුම බැර රු. 500
මුදල් ගිණුම බැර රු. 9500

ii.මුදල් ගිණුම හර රු. 9500
දුන් වට්ටම් ගිණුම හර රු. 500
ණයගැති ගිණුම බැර රු. 10000

iii.ණයගැති ගිණුම හර රු. 9500
දුන් වට්ටම් ගිණුම හර රු. 500
මුදල් ගිණුම බැර රු. 10000

iv.මුදල් ගිණුම හර රු. 10000
දුන් වට්ටම් ගිණුම්ද් බැර රු. 500
ණයගැති ගිණුම බැර රු. 9500

| (A) ගනුදෙනුව | (B) මූලාශ්‍ර ලේඛනය |
|---|---|
| 1. රු. 80000 ක අත්පිට විකුණුම් | A සුළු මුදල් ගෙවීම් වවුචරය |
| 2. ගෙවන ලද තැපැල් වියදම රු. 45 | B තැන්පතු ලදුපත |
| 3. ණයහිමියන්ට රු 7500 ක් ගෙවීම | C රිසිට් පත |
| 4. බැංකුවේ රු. 100000 ක් තැන්පත් කිරීම | D ගෙවීම් වවුචරය |

38) A තීරුව B තීරුව සමග ගැළපූ විට නිවැරදි පිළිතුර වන්නේ,

i. CBAD ii. CDBA iii. CADB iv. DCBA

39) 2024.01.31 දින කමල්ගේ ව්‍යාපාරයේ සුළු මුදල් ශේෂය රු. 800 කි. මෙදින ප්‍රධාන මුදල් භාරකරු විසින් සුළු මුදල් භාරකරුට රු. 1200 ක් අග්‍රිමය ප්‍රතිපූර්ණය සඳහා ලබා දෙන ලදී. ඒ අනුව ජනවාරි මාසයේ සුළු මුදල් වියදම් වටිනාකම වන්නේ,

i. රු. 750 ii. රු. 2000 iii. රු. 1200 iv. රු. 2200

40) ඉහත සඳහන් විස්තරයට අනුව කමල්ගේ ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමය වටිනාකම කීයද?

i. රු. 750 ii. රු. 2000 iii. රු. 1200 iv. රු. 2200